# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1912/34 - 2015 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### බදුල්ල මුතියංගන රජමහා විහාරස්ථානයේ වාර්ෂික පෙරහැර

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥා පනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් මස 10 දාතම අංක 9902 ගැසට් පත්‍රයේ ද, 1951 අගෝස්තු 17 දාතම අංක 10283 ගැසට් පත්‍රයේද, 1955 මාර්තු 25 දාතම අංක 14778 ගැසට් පත්‍රයේද, 1992 අංක 58 බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරු) පනත අනුව, 2011.06.10 වන දින අංක 1710 දරන ගැසට් පත්‍රයේද, පළ වූ බදුල්ල මුතියංගන රජ මහා විහාරස්ථානයේ (වාර්ෂික පෙරහැර) පිළිබඳ ව්‍යවස්ථාව අනුව ද බදුල්ල ප්‍රාදේශීය ලේකම් පී. එස්. පී. අබේවර්ධන වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2015 බදුල්ල මුතියංගන රජ මහා විහාරස්ථානයේ පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පනවමි.

1. 2015 මැයි මස 02 වන දින ඇතුල් පෙරහැර මංගල්‍යය ආරම්භ වී 2015 මැයි මස 03 සහ 04 යන දෙදින තුළ පෙරහැර වීදි සංචාරය කිරීමෙන් මුතියංගන විහාරස්ථානයට ගෙවදීමෙන් පසු පෙරහැර අවසන් වන බව දැනුම් දෙමි.

2. පෙරහැරේ ගමන් මාර්ගය :-
   2015 වෙසක් මස 02 වන දින ඇතුල් පෙරහැර මංගල්‍යය

   2015 වෙසක් මස 03 මුතියංගන විහාරස්ථානයෙන් පිටත් වී අනගාරික ධර්මපාල මාවත, පහළ රජ වීදිය, කොකොවත්ත පාර, උදයරාජ මාවත, බසාර් වීදිය අසලින් මුතියංගන පාරෙන් (පහළ වීදියෙන්) මුතියංගන විහාරස්ථානයට ගෙවැදීම.

3. බදුල්ල මුතියංගන විහාරස්ථානය පිහිටි භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම හා වෙළඳාම් කිරීම තහනම් කරමි.

4. පෙරහැර කාලය තුළදී ප්‍රධාන මාර්ග වල පෞද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථ වාහන මගෙන් හෝ මුතියංගණ භාරකාර විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ බලපත්‍රයක් නොමැතිව විහාරස්ථාන භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

5. පෙරහැර ගමන් ගන්නා මාර්ගයන්හි බදුල්ල මහ නගර සභාව මගින් විධිමත් අනුමැතියකින් ඉදි කරනු ලබන ගොඩනැගිලි හා දැනට ඇති ස්ථිර ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළඳුන් විසින් විහාරස්ථාන පෙරහැරින් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු පෙරහැර ගමන් ගන්නා මාර්ගය හා විහාරස්ථාන භූමිය තුළ පොලිතින් ඇතුළු සියළුම අප ද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

1A - G 21471 — 56 (2015/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව පූජා භූමිය හා එහි අවට කිසිම තාවකාලික හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

7. කිසිවකු විසින් මාගේ හෝ බදුල්ල මහ නගර සභාව මගින් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර තබන්නාවූ හෝ යම් බිමක් හෝ පූජා භූමි ප්‍රදේශයක් තුළ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකල යුතුය.

8. රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

9. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිළධාරියකුගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් අංක 03 හි දැක්වෙන කඳවුර ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය.

පී. එස්. පී. අබේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2015 අප්‍රේල් මස 28 වන දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 389

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.